සෝවියට් ලේඛිකා

ඊ. සෙරෝවා

ඉත්තෑවගේ අත්මේස්



මහින්ද සෙනරත් ගමගේ

ඉත්තෑවගේ අත්මේස්



මහින්ද සෙනරත් ගමගේ

සිතුවම්

බී.කලචුෂින්

පරිගණක සැකසුම

ගයානී නිලංකා ගලගෙදර

මුද්‍රණය සහ ප්‍රකාශනය


සයුරි ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස්

අංක: 102/176


මත්තේගොඩ නිවාස සංකීර්ණය පාර - මත්තේගොඩ

දුර : 0115 - 676483 - 0715 - 181421

ෆැක්ස් : 0112 - 844961



කවුරුද පොහොසත්





පොළොව යටින් බිම් ගෙයයි
උණුසුම් කාමර ගොඩයි
එය හෑරුව වැලි මීයට
හරියට ආඩම්බරයි

කෑම කාමරෙයි, ගබඩාවයි
එතකොට කුස්සියයි
නිදන කාමරෙයි
පාඩම් කාමරයත් හරි අගෙයි

හා පැංචට ගෙයක් නැතේ
ඉන්නට ඒ වගේ
සෙල්ලම් කරමින් එනමුත්
කියන්නෙ මේ ලෙසේ

කවුරු කොහොම කිව්වත්
වැඩිපුර පොහොසත් මමයි
බලන්න මේ රන්වන් රන්
හිරු අයිතිය මටයි

තේරවිල්ලක්

හැඩ වැඩ වී ඇඳුම් ඇන්ද - කෙළිලොක් මේ පැංචි කවුද ?
බැරිනම් එය හිතා ගන්න - පොත හරවාලා බලන්න

(ලුලුලු)



නරි හාමිනේ

මගේ ඇඟේ අළු පාටට ලොම් පිරිලාලු
මට කිසි දා ලැජ්ජාවක් දැනෙන්නෙ නැතිලු



මම තාරාවුන් හා කුකුළන් කනවාලු
කපටි කමේ මගෙ ළඟ කිසි අඩුවක් නැතිලු

මේ කවුද ?

මගේ පිටේ කූරු කූරු තියෙන්නේ
උලට උලයි ඒවා පොඩි ළමුන්නේ
සතුරකු විත් මා බය කළ සැණින්නේ
ඉඳිකටුවල විස ඔහු හට දැනෙන්නේ




කෑ ගහලා මා මේ ලෙස අසන්නේ
"වෘකය ඉඳිකටුවල රස බලන්නේ ?"






ඔහු එතකොට කරුණාවෙන් කියන්නේ
"ස්තූතියි අද රෑ මම නොකන්නේ"




ඉත්තෑවගෙ අත් මේස්

රත්තරං වගේ හරි හොඳ ඉත්තැ බබාලා
දන්නවාද ඇයි බිය සුළු වෙන්නෙ කියාලා





ඉත්තෑ අත් මේස් දෙකක් දෑතට දාගෙන
අම්මා ඒ අය නළවන නිසාය වැඩියෙන



ගෝනා දුන් කෑම වේල



නරි හාමිනෙ ගියා ගෝන ගෙදරට කෑමට
ගෝනා හොඳ රස කෑමක් තිබ්බා මේසෙට
රසකර කන්නට පුළුවන් වුණාට ගෝනට
හරියන්නේ කොහොමද ඒවා නරි කටකට



අත්තටු ඇති මීයා



ඉඳගෙන හැම දෙන තේ බොනවා මී මැදුරේ
මී පැංචා පුරසාරම් කී ඒ අතරේ
දුන්නොත් අත්තටු පියඹනවා අතු පතරේ
උකුසු රජෙක් වී පෙන්වන්නෙමි උඩ අඹරේ



මී පැංචා පැතූ ලෙසින් අත්තටු ලැබුණා
පියාඹලා ඌ උඩ උඩු ගුවනට නැගුනා
උකුසු රජෙක් නම් කොයි දෙසවත් නැත පෙනෙනා
වවුල් මොටෙක් අත්තටු සලනා හඬ ඇසුනා

වෘක පැටව්





කොට්ට වගේ පාදවලින් දුවගෙන එනවා
සුදු පාටට දත් නියවාගෙන ගොරවනවා

ඒත් වෘකයෝ යන විට දඩයම් ගමනේ
නැත උන් ගොරවන්නේ හෝ උඩුබුරලන්නේ


බඩගිනි වෘකයා හරිම නපුරු වුණාට
හොඳටම බය වී දුවනව වෙඩි සද්දෙකට





හා පැංචකු සමඟ කතාවක්

"එහෙට වැනෙන මෙහෙට වැනෙන
කන් දෙක වදයකි
පුළුන් කොට්ට වැනි කකුලෙන්
මොනවද කළ හැකි
පුංචිම පුංචියට ඉන්න මං අසරණයෙකි
මට ඇත්තේ බියෙන් හැමවිටම පිරී ඔළුවකි"




"ආදර පොඩි හා පැංචෝ
එපා අඬන්නට
නුඹේ පා වලින් හැකි
වේගයෙන් දුවන්නට
දිග කන් දෙක උදව් දේවි
හොඳින් ඇහෙන්නට
හැබැයි බයෙන් ඉඳීම
නං හිටින්නෙ නරකට"

ගොළුබෙලි ගෙදර

කටුවක් වැනි හැඩයක් ඇති අර ගේ   දුටුවද
ගෙයි දොර ඇර තබලා තියෙනා හැටි   දුටුවද

ගේ හිමි ගොළු බෙලි හාමිගේ හිත හරි   සතුටුය
හැම පැත්තෙම ඉන්නා අය ඔහු හා   මිතුරුය




කුරුමිණියන් හට මාළුන් හට මැස්සන්   හට
හිස නමමින් සිනා පානවා ඔහු හැම   විට
හිස ඇති අං දෙක ලෙලවන්නේ උඩු   ගුවනට
ඕනෑ හින්දා ඔහු හට සතුටින්   ඉන්නට




ඒත් මෙන්න ළඟින් ඇදෙන්නේ පොකිරිස්සෙක්
ඒ නං ගොළු බෙල්ලා බියකරවන සතුරෙක්

"සුබ දවසක් වේවා ගොළු බෙලි මහත්තයෝ
එළියට ඇවිදින් පොඩ්ඩක් කතා කරමුකෝ"



"අපොයි භයානක අය හා කතා හොඳ නැතේ
දොර අරින්ට නං කිසි අදහසක් මගෙ නැතේ"





සයුරි ප්‍රකාශන
අංක 102/176
මත්තෙගොඩ නිවාස සංකීර්ණය පාර
මත්තෙගොඩ
දුරකතන : 0115-676483 0715 181421 ෆැක්ස් 0112 844961

ISBN 978-955-1889-02-9 80/-